# තෙල වැඩිවීම

ලෝක වෙළෙඳපොළේ තෙල් මිල තව තවත් වැඩිවෙයි. ලංකාවේ පෙට්‍රල් ලීටරයක මිල රුපියල් දෙසීය ඉක්මවන දිනය වැඩි ඈතක නො වෙයි. තෙල් මිල වැඩිවීම පිළිබඳ මෙරට විරුද්ධ පක්ෂය දන්නේ විරෝධය පෑම ය. ඔවුන් ඒ සඳහා යොදාගත් උපක්‍රමය නම් එතරම් නරක නැත. ගොන් කරත්තවලින් යෑමෙන් සංකේතවත් වන්නේ අප තෙල් මත පරායත්ත නොවන (රඳා නොපවතින) ප්‍රවාහන මාධ්‍යයක් ගැන සිතිය යුතු බව නම් එහි වරදක් දැකිය හැකි නො වෙයි. එහෙත් මැතිවරණ පහළොවක් එක දිගට පැරදීමෙන් පසුවත් "අපේ ගොනා අපට හොදා" යනුවෙන් සටන්පාඨ කීම නම් එතරම් හොඳ ක්‍රියාවක් නොවන බව ඕනෑම ගොනකුට අවබෝධවනු ඇත. කෙසේ වෙතත් "අප යන්නේ කොයි පාරේ අපේ ගොනා යන පාරේ" ආදී වශයෙන් සටන්පාඨ නොකීම කිසියම් ගොනකුට ප්‍රශ්නයක් වී දැයි රාජ්‍ය නොවන සංවිධානවල " බුද්ධිමතුන්ගෙන් " හා බටහිර රටවල තානාපතිවරුන්ගෙන් අසා දැනගත යුතු ය.

එක්සත් ජාතික පක්ෂයේ අනුගාමිකයන්ගේ කෙසේ වෙතත් ඉහළ පෙළේ සාමාජිකයන්ගේ තෙල කවදත් වැඩි යැයි බොහෝ දෙනා පවසති. තෙලෙන් දුවන රථයෙන් පැමිණ තෙල අඩුකරගැනීම සඳහා පිටිටනිවල කකුල් දෙකෙන් දුවන මහතුන්ගෙන් හා නෝනා මහතුන්ගෙන් වැඩි දෙනා එජාප හිතවතුන් හා හිතවතියන් යැයි ද ඒ සමග පැවසෙයි. ඒ කෙසේ වෙතත් කලකට පෙර කොළඹ විශ්වවිද්‍යාලයෙහි බටහිරින් ආනයනය කෙරෙන පඬි තෙල වැඩි වූ ශිෂ්‍ය පිරිසකට අනුව ජාතික චින්තනය යනු අනුරාධපුරයට බරකරත්තයෙන් ආපසු යෑමක් විය. ඩෙරීඩාගේ හා ෆූකෝගේ ප්‍රංශ පඬි තෙල වැඩි වී ඔල්මොරොන්දත් වී සිටින පිරිසකට අනුව අප කරන්නේ හයිඩැගර් නම් දාර්ශනිකයා කළ දේම ය. මේ ඔල්මොරොන්දන්කාරයන්ට අනුව බටහිර නූතනත්වයට එරෙහිව හයිඩැගර් පඬිවරයා ආපසු පැරණි යුරෝපයට යෑමට වලිකෑවේ ය. ඔවුන්ට අනුව අප දඟලන්නේ ආපසු සිංහල බෞද්ධ ක්‍රමයකට යෑම ය. එහෙත් මෙහි වෙනසක් වෙයි. බටහිර නූතනත්වය උපන්නේ පැරණි යුරෝපයෙන් ය. හයිඩැගර්ට නූතනත්වයට එරෙහිව විකල්පයක් නො වී ය. එහෙත් අපට විකල්පයක් ඇත. ඒ අනුරාධපුරයට බරකරත්තයෙන් ආපසු යෑම නොව අනුරාධපුර චින්තනයට ආපසු යෑම ය. එසේ ආපසු යෑම අපට පමණක් නොව ලෝකයේ කාට කාටත් යහපතක් උදාකරනු ඇත.

ඉන්දියාව හා චීනය බටහිර දියුණුව නමැති උරවක්‍රමාලය කරේ දමාගත් පසු ලෝකයේ ඉන්ධන අවශ්‍යතාව වැඩි වී ඇතැයි පැවසෙයි. එහෙත් ඒ අතර බටහිර ඉන්ධන අවශ්‍යතාව ද වැඩි වී ඇත. අද ඉන්ධන යනු මූලික වශයෙන් ම පෙට්‍රෝලියම් ඉන්ධන ය. පෙට්‍රෝලියම් ඉන්ධන නිධි ශීඝ්‍රයෙන් ක්ෂය වී යමින් පවතියි. ඒ වෙනුවට විකල්ප ඉන්ධන ආහාරවලින් නිෂ්පාදනය කිරීමට යෑමෙන් ආහාර ප්‍රශ්නය තවත් උග්‍ර වී ඇත. අද ප්‍රශ්න පිටුපස විසඳුම් ද විසඳුම් පිටුපස නැවත ප්‍රශ්න ද වෙයි. ගොනා පසුපස යන (එ ජා පාක්ෂිකයන්ගේ නොව) කරත්තය මෙන් අපි නූතනත්වයේ ප්‍රශ්න පිටුපස යමින් සිටින්නෙමු. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කරන්නක් නොව ප්‍රශ්න ඔස්සේ තව තවත් ප්‍රශ්න ඇතිකරන්නක් පමණක් වෙයි.

අප විදුසර ලිපි පෙළ මගින් විස්තරාත්මක ව පෙන්නුම් කර ඇත්තේ බටහිර නූතනත්වයේ චින්තනයෙහි, එනම් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඇති සමාජය වෙනුවට පුද්ගලයා අදාළ ද්වීමය ප්‍රතිවිරුද්ධතාවෙහි (බයිනරි ඔපසිෂන්) ප්‍රධානත්වයට පැමිණීම, සංස්ලේෂණය අභිබවා විශ්ලේෂණය ඉදිරියට පැමිණීම, සංයුක්තය වෙනුවට වියුක්තය කරට ගැනීම ආදිය ද, මිනිසා මිනිසාගෙන් (පවුලෙන්) මෙන් ම ස්වභාව ධර්මයාගෙන් ද වෙන්කිරීම, මිනිසාගේ ඉන්ද්‍රිය පිනවීමට මුල් තැන දීම, හැඟීම්වලට වහල්වීම (ලංකාවේ එක් වෙළෙඳ දැන්වීමකින් හැඟීම්වලට වහල්වීමට කියා දෙනු බොහෝ දෙනා දැක ඇත.) ආදිය ද බටහිර නූතනත්වයේ චින්තනයේ ලක්ෂණ බව ය. බටහිර ධනවාදය මෙන් ම බටහිර විද්‍යාව ද බිහිවූයේ එවැනි පරිසරයක ය. ජෝසප් නිඩ්හම් විද්වතා බටහිර විද්‍යාව බටහිර ඇතිවීමට හේතුව ධනවාදය  යැයි කීවේ ප්‍රශ්නය ගැඟ එතරම් අවබෝධයකින් නො වේ. බටහිර විද්‍යාව මෙන් ම ධනවාදය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵල වෙයි. පහළොස්වැනි සියවසේ ඇති වූ චින්තන විප්ලවය නොවන්නට ලෝකය මෙයට වඩා යහපත් තැනක් වීමට තිබුණි.

මධ්‍යතන යුරෝපයේ ද ආකල්පය වූයේ ලෝකය මවා ඇත්තේ මිනිසාගේ, එනම් ඔවුන් දුටු ආකාරයට පිරිමියාගේ, යහපත වෙනුවෙන් බව ය. ගැහැණිය ද මවා ඇත්තේ පිරිමියා සඳහා ය යන්න බටහිර ආකල්පය වෙයි. ආදම් වෙනුවෙන් ඒව මැවුවා මිස ඒව වෙනුවෙන් ආදම් මවනු නො ලැබිණි. ඊනියා පුරුෂාධිපත්‍යයේ මුල එතැන ය. එකල

© Prof. Nalin De Silva

ලෝකය සූරාකෑමට අවශ්‍ය තාක්ෂණික දැනුම බටහිරයන්ට නොමැති විය. ඔවුන් ඒ දැනුම ලබාගත්තේ නූතනත්වයෙන් පසුව ය. ඉන්ද්‍රිය පිනවීම හා පෞද්ගලිකත්වය මුල්තැනට පත්වීමෙන් පසුව තාක්ෂණයේ උපකාරයෙන් මුළු ලෝකය ම සූරා කෑ බටහිරයෝ අද අඟහරු ඇතුළු අනෙක් ග්‍රහවස්තු සූරාකන්නේ කෙසේ දැයි කල්පනාකරමින් සිටිති. මෙහි දී කිවයුතු කරුණක් වන්නේ කසිකබල් මාක්ස්වාදය මොන සූරාකෑමට විරුද්ධ වුවත් ලෝකය සූරාකෑමට විරුද්ධ නැති බව ය. කාල් මාක්ස් විද්වතාට ප්‍රශ්නය වූයේ ධනපති පංතියේ සරාකෑම ය. ඊනියා කම්කරු පංතිය (එවැනි පංතියක් බෙහෙතකටවත් සොයාගැනීමට නො හැකි ය. එය මාක්ස්ගේ මනසේ ඇති වූ හිතළුවක් - ඇතැමුන්ගේ භාෂාවෙන් ෆැන්ටසියක් - පමණ ය.) ලෝකය සූරාකෑම මාක්ස්වාදයට ප්‍රශ්නයක් නො වෙයි. ලෝකයේ පෙට්‍රෝලියම් ඉන්ධන ඇත්තේ සීමිත ප්‍රමාණයක් බව ගොන් කරත්ත පෙළපාලියේ ගිය එජාප නෝනා මහත්මීහු ද දනිති යැයි සිතමි. ඔපෙක් රටවලට තම ඉන්ධන නිධි ඉක්මනින් අවසන්කර ගැනීමට අවශ්‍ය නො වේ. ලෝකයට අවශ්‍ය යැයි කියන ප්‍රමාණයට අද ඉන්ධන නිෂ්පාදනයක් සිදු නොවන බැවින් තෙල් මිල දිනපතා ඉහළ යයි. මෙය තෙල් සම්බන්ධයෙන් පමණක් නොව ලෝකයේ අනෙක් සම්පත් සම්බන්ධයෙන් ද වලංගු වෙයි. උද්ධමනයට මූලික හේතුව සම්පත් සරාකෑම බව සීමිත සම්පත්වලින් අසීමිත අවශ්‍යතා සපුරාලීමට කැසකවන බටහිර ආර්ථික විද්‍යාඥයන්ට අවබෝධ නො වේ. ලංකාවේ ආර්ථික විද්‍යාඥයන්ට අවබෝධ වන්නේ බටහිර ඔවුන්ගේ ස්වාමීන්ට අවබෝධවන්නෙන් සුළු ප්‍රමාණයකි.

ඉන්ධන ප්‍රශ්නයට පිළියම කුමක් ද? තාක්ෂණයේ ආධාරයෙන් ඇතැම්විට යම් දිනෙක අනෙක් ග්‍රහවස්තුවකින් පෙට්‍රෝලියම් හෝ වෙනත් ඛනිජ ඉන්ධන (ඒ ග්‍රහවස්තුවට සාපේක්ෂ ව) ලබාගැනීමේ හැකියාව වෙයි. එහෙත් අද එය කළ හැකි නො වේ. ඒ කෙසේ වෙතත් එහි කෙළවර කුමක් ද? සමස්ත විශ්වය පුරා ඉන්ධන සොයමින් කරක් ගැසීම ද? අද ලංකාවේ නම් තරුණයන් විශාල පිරිසක් කරන්නේ ක්‍රිකට් ගැසීම, රස්තියාදු ගැසීම හා අඩි (මත්පැන් හා මත්ද්‍රව්‍ය) ගැසීම ය. ඒ අතර ඉතා සුළු පිරිසක් ඉංගිරිසි පොතක් කියවා තේරුම් ගෙන හෝ නොගෙන හෝ ඒ පිළිබඳ කයිවාරු ගසති. පොත වෙනත් කිසිවකු කියවා නැත්නම් කයිවාරුව ද මිලෙන් කෙසේ වෙතත් අගයෙන් ඉහළ යයි. ඇතැම් පුවත්පත්වල ඊනියා ශාස්ත්‍රීය සංවාද යනුවෙන් කෙරෙන්නේ මේ කයිවාරු ගැසීම් ය. මේ කයිවාරු ගසන්නන් ඉහත සඳහන් අනෙක් ගසන්නන්ට ද වඩා භායානක වන්නේ ඔවුන් තමන්ගේ ඔළුව නරක් කරගත්තා මදිවාට අනෙක් අයගේ ද ඔළු නරක් කරන බැවිනි. මේ කයිවරු ගසන්නන් නම් විශ්වයේ කරක් ගැසීම සඳහා බටහිරයන් වෙතට යැවිය හැකි ය. ඔවුන්ට එවිට කරක් ගසමින් ම (සිංහලෙන්) කයිවාරු ගැසීමට හැකිවනු ඇත.

අනෙක් රටවල් ඊනියා දියුණුව පිටුපස හඹා යද්දී අප කළ යුත්තේ අපේ ආර්ථිකයක් ඇතිකර ගැනීම ය. අපේ ජාතික ආර්ථිකයක් යනු ඊනියා මිශ්‍ර ආර්ථිකයක් නො වේ. අප ඇතිකළ යුත්තේ ඉන්ද්‍රිය පිනවීමට මුල් තැනක් නෙදෙන හැඟීම් පාලනය කිරීමට උගන්වන සිංහල බෞද්ධ ආර්ථිකයකි. එහෙත් මේ සිංහල බෞද්ධ ආර්ථිකය ඇත්තේ කොහේ ද? එය ෂුමාකර්ගේ පුංචි නම් ලස්සනයි (ස්මෝල් ඉස් බියුටිෆුල්) පොතේ බෞද්ධ ආර්ථිකය නම් පරිච්ඡෙදයේ නැත. එසේ ම එය ත්‍රිපිටකයේ ද නැත. ත්‍රිපිටකයේ ඇති බෞද්ධ ආර්ථික සංකල්ප වැනි දෑ පශ්චාත් උපාධි නිබන්ධන මාතෘකා පමණකි. ඒ නිබන්ධනවලින් ලෝකයටවත් බෞද්ධ සංස්කෘතියටවත් අබමල් රේණුවක යහපතක් සිදු නො වේ. බටහිර ආර්ථිකය බයිබලයේ නැත. එහෙත් ඒ ආර්ථිකය පදනම් වී ඇත්තේ බයිබලයෙහි ය. අප කළ යුත්තේ ත්‍රිපිටකය මත පදනම් ව බෞද්ධ ආර්ථික සංකල්ප හා ප්‍රවාද නිර්මාණය කිරීම ය. සමස්ත ආර්ථිකය ගැන කතාකිරීමට මෙහි දී නො හැකි ය. එහෙත් සංක්‍රමණීය වශයෙන් අපේ අවශ්‍යතා සීමාකිරීමට අපට හැකි නම් හා කොළඹට මිනිසුන් හා පාසල් සිසුන් ගෙන්වීම සීමාකිරීමට හා ආහාර වගාව සම්බන්ධයෙන් පිටරට මත නොයැපෙන ක්‍රමයක් සකස් කරගැනීමට හැකිනම් අපට සුළුවෙන් හෝ ඉදිරියට යා හැකි ය. අද අප රටේ ක්‍රියාත්මක වන අධ්‍යාපනයෙන් රටට එතරම් වැඩක් නැතිවුවත් අපට ගැලපෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස්කරගන්නා තුරු අපට ඒ ක්‍රමය පවත්වාගෙන යෑමට සිදු වී ඇත. කොළඹට සිසුන් පැමිණීම අඩුකළ හැක්කේ පසුගිය අවුරුදු පනහ ඇතුළත කොළඹ ම බිහිවූ මහානාම ඩී එස් සේනානායක වැනි විදුහල් මට්ටමේ පාසල් අඩුම තරමින් සීයක් (පිස්සුවක් වී ඇති පිහිනුම් තටාක නැතිව - තටාකයට වැයවන මුදලින් සාමාන්‍ය මට්ටමේ පාසලක් ඉදිකළ හැකි යැයි සිතමි) දිවයින පුරා ඇතිකිරීමෙන් ය. ඒ අතර ඉන්ධන හා ඉන්ධන මත යැපෙන පොහොර ද නැතිව ගොවිතැන් කිරීමට අප වහාම පුරුදු විය යුතු ය. අද කුඹුරු ගොවිතැනින් පාඩු වන්නේ පරාක්‍රමබාහුගේ ක්‍රමයට නොව සුද්දාගේ ක්‍රමයට වැඩ කිරීම නිසා ය.
(විස්තර පසුවට)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva